සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 08 - ශ්‍රේණිය

## ඉතිහාසය

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02 යි.

I කොටස

පියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පණ්ඩුකාභය රජතුමා කර වූ වැව් අතර දනට හඳුනාගෙන ඇති වැව වන්නේ,

(1) ජය වැව (2) අභය වැව (3) ගාමිණී වැව (4) තුරුළු වැව

(02) අතීත ශ්‍රී ලාංකිකයන් දිගු ඇළ මාර්ග තැනීමට පෙළඹි වීමට බලපෑ හේතු කිහිපයකි. ඊට අදාළ නොවන පිළිතුර තෝරන්න.

(1) වැව්වල හෝ අමු ණුවල සිට වගා බිම් කරා ජලය ගෙන යාමට

(2) අමුණක සිට වැවකට හෝ වැව් පද්ධතියකට ජලය ගෙන යාමට

(3) ගංවතුර ගැලීම් පාලනය කිරීමට

(4) වැවක සිට වැවකට හෝ වැව් කිහිපයකට ජලය ගෙන යාම

(03) වැලිවිට ශ්‍රී සරණංකර හිමිපාණන්ට "සංඝරාජ" පදවිය පිරිනැමූ උඩරට පාලකයා කවුරුන් ද?

(1) පළමුවන විමලධර්මසූරිය රජු (2) ශ්‍රී විජය රාජසිංහ රජු

(3) ශ්‍රී වික්‍රම රාජසිංහ රජු (4) කීර්ති ශ්‍රී රාජසිංහ රජු

(04) යුරෝපයේ පුනරුදය ඇති වීමට බල පෑ ආසන්නතම හේතුව වූයේ,

(1) කොන්ස්තන්තිනෝපලය තුර්කීන්ට යටත් වීම යි.

(2) වෙළෙඳාම දියුණු වී ධනවත් පිරිසක් බිහි වීම යි.

(3) යුරෝපා විශ්ව විද්‍යාලවල නව විෂයයන් ඉගැන්වීම නිසා නව උගතුන් බිහි වීම යි.

(4) මුද්‍රණ යන්ත්‍රය නිපදවීම නිසා පොත්පත් මුද්‍රණය කිරීම පහසු වීම යි.

(05) පව් සමා කිරීමේ පත්‍ර විකිණීමට එරෙහිව පිය අදහස් ඇතුළත් පත්‍රිකාවක් විටෙන්බර්ග් දේවස්ථානයේ දොරේ අලවන ලද පූජක තුමා,

(1) ජෝන් හස් ය. (2) ජෝන් කැල්වින් ය.

(3) ජෝන් වයික්ලිෆ් ය. (4) මාටින් ලූතර්

• 06 සිට 10 තෙක් ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන තුළ ලියන්න.

(06) කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යාමට ........................................ රජු විසින් ජයගඟ හෙවත් යෝධ ඇළ ඉදිකරවන ලදි. (ධාතුසේන/ අග්ගබෝධි)

(07) රජරට ශිල්පාචාරයට අයත් විශිෂ්ටතම "ආයකය" නිර්මාණය කර ඇත්තේ ........................................ චෛත්‍යයේ ය. (අනුරාධපුර ජේතවනාරාම/ මිහින්තලේ කන්ටක)

(08) ශ්‍රී ලංකාවේ මහායාන අදහස් පැතිර යාමත් සමග ........................................ ප්‍රතිමා වන්දනාව ජනප්‍රිය විය. (බුද්ධ / බෝධිසත්ව)

(09) මහනුවර දළදා මාලිගාවට පත්තිරිප්පුව එක් කිරීමට ........................................ රජතුමා කටයුතු කරන ලදි. (ශ්‍රී වික්‍රමරාජසිංහ/ කීර්ති ශ්‍රී රාජසිංහ)

(10) සිංහල රාජ වංශයේ අවසන් සිංහල රජු වන්නේ ........................................ ය. (ශ්‍රී වික්‍රමරාජසිංහ/ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ)

• 11 සිට 15 තෙක් ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ නිවැරදි නම් "✓" ලකුණ ද වැරදි නම් "✗" ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ ලියන්න.

(11) යුරෝපයේ පුනරුදය මුලින් ම ආරම්භ වූයේ ඉතාලියෙනි. ( )

(12) පෘතුගාලය හා එංගලන්තය දේශගවේෂණ කටයුතු සඳහා මුලින් ම යොමු වූ යුරෝපා ජාතීන් දෙක ලෙස සැළකේ. ( )

(13) මුහුදු ගවේෂණයේ යෙදුනු ක්‍රිස්ටෝපර් කොලොම්බස් විසින් 1492 දී අත්ලාන්තික් සාගරයේ හිස්පැනියෝලා දූපතට ගොඩ බැස්සේ ය. ( )

(14) ජාවා දූපතේ පිහිටි බතාවිය පෘතුගීසීන් විසින් ඔවුන්ගේ පෙරදිග මූලස්ථානය ලෙස යොදා ගන්නා ලදි. ( )

(15) ආසියාතික රටවල තම ආගම පැතිරවීම යුරෝපීයයන් ආසියාවට පැමිණීමට බලපෑ එක් අරමුණක් විය. ( )

• 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන පුරවන්න.

(16) 1505 දී පෘතුගීසීන් ලංකාවට පැමිණෙන විට කෝට්ටේ රාජ්‍යයේ පාලකයා වූයේ ........................................ රජු ය.

(17) මුලින් ම ලෝකය වටා ගමන් කළ දේශගවේෂකයා ........................................ ය.

(18) සෙනංගොඩ උයනේ දී උණ කටුවක් සතුලේ ඇනී විෂ වීමෙන් ........................................ රජු මිය ගියේ ය.

(19) පෘතුගීසීන් විසින් මහ බද්දේ දෙපාර්තමේන්තුව පිහිටුවන ලද්දේ ........................................ වෙළඳාම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා ය.

(20) 'පැරිෂ් පාසල්' ආරම්භ වූයේ ........................................ පාලන සමයේ දී ය.

## II කොටස

- පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

(01) (අ) යාබද සිතියමේ දක්වා ඇති අක්ෂරවලට අදාළ ස්ථාන පහත ලැයිස්තුවෙන් තෝරා සිතියමේ අදාළ අක්ෂරය ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.

(i) මහනුවර


(ii) ගාල්ල

(iii) යාපනය

(iv) අනුරාධපුරය


(v) කෝට්ටේ

(vi) පොළොන්නරුව




(ලකුණු 06)

(ආ)



A

(i) A රූපයෙන් දක්වෙන්නේ කුමක් ද?

(ii) මෙම නිර්මාණය පිහිටි නගරය කුමක් ද?

(iii) මෙම නිර්මාණය කරවන ලද පාලකයා කවුද? (ලකුණු 06)

(ඇ) (i) B රූපයෙන් දක්වෙන්නේ කවුරුන් ද?

(ii) මෙතුමා විසින් පාලනය ගෙන ගිය රාජ්‍යය කුමක් ද?

(iii) මොහු අයත් වන රාජ්‍ය වංශය කුමක් ද? (ලකුණු 06)



B

(02) (i) අනුරාධපුර යුගයේ ඉදිකරන ලද වැව් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) A - වැවක ප්‍රධාන අංග දෙකක් නම් කරන්න.

B - එම අංග මගින් ඉටුවන කාර්ය වෙන වෙන ම සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අතීත ජනයා පොකුණු තැනවීමට බලපෑ හේතු දෙකක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(03) (i) පැරණි සෙල්ලිපි වල,

A - කබර B - තොපශ C - තඹර

යනුවෙන් සඳහන් කර ඇත්තේ කුමන කර්මාන්ත ද යි පිළිවෙලින් ලියා දක්වන්න. (ලකුණු 03)

(ii) A - අතීතයේ ශ්‍රී ලංකාවේ යකඩ නිස්සාරණය කළ ආකාරය පිළිබඳ ව පැහැදිලි සාක්ෂි හමු වී ඇති ස්ථාන දෙක සඳහන් කරන්න.

B - එම ස්ථාන දෙකේ යකඩ නිස්සාරණය සඳහා සුළං බලය ලබා ගත්තේ කෙසේද යන්න වෙන් වෙන් ව සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) අතීත ශ්‍රී ලංකාවේ මැටි තාක්ෂණයේ දියුණුවක් පැවති බව කරුණු දෙකක් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (i) උඩරට රාජ්‍ය හැඳින්වීමට භාවිත කළ වෙනත් නම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) A - පළමුවන විමලධර්මසූරිය රජතුමාගෙන් ආරම්භ වූ නව රජ පෙළපතට අයත් වෙනත් රජවරු දෙදෙනකු නම් කරන්න.

B - පළමුවන විමලධර්මසූරිය රජුගෙන් ඉටු වූ ආගමික සේවාවන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) උඩරට රාජ්‍යයේ පැවැති ආර්ථික තත්ත්වය කරුණු දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(05) (i) යුරෝපයේ මධ්‍යතන යුගය අවසානයේ බිහි වූ විශ්ව විද්‍යාල තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) A - පුනරුද පමයේ වෛද්‍ය විද්‍යාව සම්බන්ධයෙන් නව සොයා ගැනීම් කළ පුද්ගලයන් දෙදෙනකු නම් කරන්න.

B - විශ්වය පිළිබඳ නව මත ඉදිරිපත් කළ දෙදෙනකු නම් කරන්න. (ලකුණු 04)

(iii) යුරෝපයේ පුනරුද පමයේ විලූ.

A - මූර්ති ශිල්පීන් දෙදෙනකු නම් කරන්න.

B - එකළ ගෘහ නිර්මාණවල දක්නට ලැබුණු වෙනස්කම් තුනක් සඳහන් කරන්න. (ලකුණු 05)

(06) "දේශගවේෂණ ආරම්භ වීමට ප්‍රථම ලෝක වෙළඳාමෙන් වැඩි කොටසක් මධ්‍යධරණී මුහුද අවට ප්‍රදේශවලට සීමා විය."

(i) මධ්‍යධරණී මුහුද ආශ්‍රිතව තිබූ වෙළෙඳ නගර තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) දේශ ගවේෂණවලට පුහුපු පසුබිමක් සකස් කළ නව සොයා ගැනීම් හතරක් සඳහන් කරන්න. (ලකුණු 04)

(iii) දේශ ගවේෂණ චාරිකාවල දී පෘතුගීසීන් ලැබූ ජයග්‍රහණ දෙකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(07) "විජයබා කොල්ලයෙන් පසු කෝට්ටේ රාජ්‍ය කොටස් තුනකට බෙදා පාලනය සිදු විය."

(i) එම කොටස් තුන නම් කරන්න. (ලකුණු 03)

(ii) A - පෘතුගීසීන් විසින් ස්වදේශිකයන් කතෝලික ආගමට හරවා ගැනීමට අනුගමනය කළ ක්‍රියාමාර්ග දෙකක් ලියන්න.

B - පෘතුගීසීන් නිසා මෙරට සමාජයට එක් වූ පෙළපත් නාම දෙකක් නම් කරන්න. (ලකුණු 04

(iii) සීතාවක රාජ්‍යයේ වර්ධනයට බලපෑ හේතු දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)